**කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන - 2019**

---------------------------------------------------------------------

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශන සටහන් සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුළත් සාරාංශයකින් සමන්විත කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ ("වැඩසටහන") - ග්‍රාමීය මූල්‍යනය හා ණය සංරචකය 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල (IFAD) අතර 2007 මැයි 08 දින එළඹි අංක 712-එල්කේ දරන වැඩසටහනේ ණය ගිවිසුමේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි ණය ගිවිසුම අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යනය හා ණය සංරචකය ක්‍රියාත්මක කරවීමේ අවසරලත් නියෝජිතායතනය වේ. ප්‍රතිලාභීන්ගේ ආයතනික ධාරිතාවය හා ගනුදෙනු කිරීමේ කුසලතා වඩා ශක්තිමත් කිරීම, සුළු තේ හා රබර් වගාකරුවන්ගේ ඉඩම් භුක්තිය පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීම, පසු අස්වැන්න පරිහරණය, ගබඩා කිරීම, ඔවුන්ගේ නිෂ්පාදන සැකසීම හා අලෙවි කිරීම හරහා නිෂ්පාදකයන්ගේ ලාභය වැඩිකිරීම, ග්‍රාමීය මුදල් හා ණය සේවා ප්‍රසාරණය හා වර්ධනය සහ කාන්තාවන් ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණුකරගැනීම හා දිළිඳු බව අඩුකිරීම තහවුරු කිරීම මෙම වැඩසටහනෙහි අරමුණු වේ. ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරකම්, සිවිල් වැඩ, වාහන, උපකරණ හා භාණ්ඩ, පුහුණු හා වැඩමුළු, තාක්ෂණික සහාය හා අධ්‍යනයන්, සේවා සැපයුම් ගිවිසුම්, කෘෂිකාර්මික යෙදවුම්, සහනාධාර හා ගැලපුම් ප්‍රදාන, ණය, වැටුප් හා දීමනා, මෙහෙයුම් හා නඩත්තු සහ වෙන් නොකළ වශයෙන් වියදම් වර්ග 12 ක් යටතේ ක්‍රියාත්මක කෙරිණි.

ණය ගිවිසුම අනුව, වැඩසටහනෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය එස්ඩීආර් (SDR) මිලියන 15.25 (එ.ජ.ඩො.මිලියන 23) කට සමාන රු. මිලියන 2,574 ක් වන අතර ඉන් එස්ඩීආර් (SDR) මිලියන 1.75 (එ.ජ.ඩො.මිලියන 2.7) කට සමාන රු.මිලියන 295 ක් වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යනය හා ණය සංරචකය සඳහා වෙන් කර ඇත. වැඩසටහනෙහි ග්‍රාමීය මූල්‍යනය හා ණය සංරචකය සඳහා වෙන් කර තිබූ මුදල 2014 සැප්තැම්බර් මාසයේදී එස්ඩීආර් (SDR) මිලියන 2.6 (එ.ජ.ඩො.මිලියන 3.8) කට සමාන රු.මිලියන 494 ක් ලෙස සංශෝධනය කර තිබුණි. උප ණය ගිවිසුමක් ශ්‍රී ලංකා රජය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අතර 2009 ජූලි 14 දින එළඹුණු අතර එය 2015 මැයි 29 දින සංශෝධනය කරන ලදි. වැඩසටහන එහි කටයුතු 2010 වර්ෂයේදී ආරම්භ කළ අතර, 2016 දෙසැම්බර් අවසන් කෙරිණි.

### 1.3 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්සාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන

කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු වන පරිදි පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 2.1 අරමුදල් උපයෝජනය

2019 දෙසැම්බර් 31 දිනට අරමුදල් සපයා ගැනීම හා උපයෝජනය පිළිබඳව වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව ග්‍රාමීය මූල්‍යනය සඳහා එකඟ වූ වටිනාකම | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂයේදී | | 2019 දෙසැම්බර් 31 දිනට | |
| | එස්ඩීආර් මිලියන | රු. මිලියන | එස්ඩීආර් මිලියන | රු. මිලියන | එස්ඩීආර් මිලියන | රු. මිලියන |
| IFAD | 2.6 | 494 | - | - | 2.48 | 488 |

### 2.2 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල හා ණය අයකර ගැනීම්වල භෞතික ප්‍රගතිය

වැඩසටහන මඟින් 2016 දෙසැම්බර් 31 වන විට සහභාගිත්ව මූල්‍යායතන 07 ක් හරහා රු. මිලියන 487.66 ක් වටිනා ප්‍රතිමූල්‍ය ණය 4,060 ක් මොණරාගල, කෑගල්ල, මහනුවර සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල ප්‍රතිලාභීන් සඳහා ප්‍රදානය කර තිබුණු 2016 දෙසැම්බර් 31 දින වැඩසටහනේ ක්‍රියාකාරකම් අවසන් වූ නිසා 2016 වර්ෂයෙන් පසුව කිසිදු ප්‍රතිමූල්‍ය ණයක් ප්‍රදානය කර නොතිබුණි. කෙසේ වුවද, 2019 දෙසැම්බර් 31 වන විටත් අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව පැවතුණි. ප්‍රතිමූල්‍ය ණය වලින් ආපසු අයකරගත් ප්‍රාග්ධන අයකිරීම්වලින් 2018 වර්ෂයේදී රු. මිලියන 445 ක මුදලක් සහ 2019 වර්ෂයේ දී රු. මිලියන 30 ක්, මෙම වැඩසටහන ද ඇතුලුව IFAD අරමුදල් ව්‍යාපෘති 03 ක් ඒකාබද්ධ කර ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාපනය කරන ලද ඒකාබද්ධ ණය මුදලකට මාරු කර තිබුණි. තවද, ප්‍රතිමූල්‍ය ණය ලෙස ලබා දුන් රු. මිලියන 3.216 ක් 2020 හා 2021 වර්ෂයන් තුළදී අයකර ගැනීමට නියමිත විය.